The Journal of Archaeology and Heritage Studies (JAHS) 2024: 11 (I) 67-79 pp

The Journal of ARCHAEOLOGY & HERITAGE STUDIES

Journal Home page http://ssh.rjt.ac.lk/index.php/jahs/

Research Paper

# කුරුණෑගල පොල්පිතිගම පෙතියාගල රජමහ විහාරය හා එහි සඟ පරපුර පිළිබඳ ඓතිහාසික අධ්‍යයනයක්

**හසිත චාමිකර ගුණසිංහ**

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය. hasithac@kln.ac.lk

## සංක්ෂේපය

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි පෙතියාගල රජමහ විහාරය, අනුරාධපුර යුගයේ ඉදි කරවන ලදුව පසුව මහනුවර යුගය දක්වා ඉතිහාසයකට උරුමකම් කියන ඓතිහාසික විහාරස්ථානයකි. ඒ යටතේ විහාර ඉතිහාසය පිළිබඳ අධ්‍යයනය කිරීමේ ක්‍රමවේදය වශයෙන් ඓතිහාසික මූලාශ්‍රය අධ්‍යයනය සහ ක්ෂේත්‍ර ගවේෂණය යොදාගන්නා ලදී. අනුරාධපුර යුගයේදී ඉදි කරවන ලද පෙතියාගල රජමහ විහාරය සඳහා පොළොන්නරු යුගයේ දී මහා විජයබාහු රජතුමාගේ (ක්‍රි.ව. 1055-1110) අනුග්‍රහය හිමි වූ බවට තොරතුරු මෙම අධ්‍යයනය මගින් හඳුනාගත හැකිවිය. මහනුවර යුගයේදී පෙතියාගල රජමහ විහාරය සඳහා වැදගත් තත්ත්වයක් හිමිව ඇත්තේ වැලිවිට ශ්‍රී සරණංකර සඟරජ මාහිමියන්ගේ ප්‍රධාන ශිෂ්‍යවර තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ බුද්ධරක්ෂිතාභිධාන මල්වතු මහාවිහාර පාර්ශ්වයේ ප්‍රථම මහනාහිමියන්ගේ ප්‍රධාන ශිෂ්‍යවර පොල්පිතිගම ශ්‍රී සිද්ධාර්ථ අනුනාහිමියන් විසින් මෙහි විහාර කර්මාන්ත කරවීම හේතුවෙනි. සිද්ධාර්ථ අනුනාහිමියන්ගේ විහාර කර්මාන්තය පිළිබඳ ප්‍රසාදයට පත් ලක්දිව අවසන් පාලකයා වූ ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා (1798-1815) විසින් පිරිනමන ලද සන්නසක් ද විහාරය සතුව පවතී. විහාරයේ ඉතිහාසය අනුරාධපුර යුගයේ පටන් ක්‍රමානුකූලව පෙළගැස්වීම සහ මෙතෙක් අප්‍රකාශිතව පැවති විහාර සන්නස හඳුනාගැනීමට මෙම අධ්‍යනයෙන් අවස්ථාව සැලසිණි.

ප්‍රමුඛ පදඃ කුරුණෑගල දිස්ත්‍රික්කය, පෙතියාගල, පොල්පිතිගම, මහනුවර යුගය, වෙහෙර විහාර

ARTICLE INFO

*Article history:*
Article Received: 06 September 2024
Revision Received: 13 April 2025
Accepted: 16 May 2025
Available online: 04 June 2025

## 1. හැඳින්වීම

කන්ද උඩරට රාජධානි සමයේ සත්කෝරළ මහදිසාවට අයත් වෙහෙර විහාර රැසකට රාජානුග්‍රහය හිමි වූ බවට සාධක රැසක් හමු වේ. මීට ප්‍රධාන හේතුවක් වූයේ එම ගම් ප්‍රදේශවලින් පැවිදි වූ භික්ෂූන් වහන්සේ බොහෝ විට රාජ ප්‍රසාදයට පත්වීමයි. ඊට අමතරව මෙයින් ඇතැම් විහාර අනුරාධපුර යුගය දක්වා දිවෙන ඉතිහාසයකට උරුමකම් කියන, ඓතිහාසික වශයෙන් වැදගත් ස්ථාන වීම ද රාජානුග්‍රහයට පත්වීමට හේතුවක් වන්නට ඇත.

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි පෙතියාගල රජමහ විහාරය ඒ ආකාරයේ ඓතිහාසික වැදගත්කමක් උසුලන විහාරස්ථානයකි. පැරණි බෙදීම්වලට අනුව මෙම විහාරය සත්කෝරළ මහදිසාවේ දිවිගන්දහය කෝරළයට අයත් වේ. කුරුණෑගල-දඹුල්ල ප්‍රධාන මාර්ගයේ පිහිටි ඉබ්බාගමුව නගරයේ සිට මඩගල්ල දක්වා දිවෙන ප්‍රධාන මාර්ගය ඔස්සේ ගල්ටැම්වැව මංසන්ධියට පැමිණ, එතැන් සිට පොල්පිතිගම නගරය



JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

දෙසට කිලෝ මීටර දෙකක් පමණ ගමන් කිරීමේදී හමුවන දකුණුපසට වැටී ඇති විහාර මාවතේ තවත් මීටර් 300ක් පමණ ගමන් කිරීමෙන් පසුව පෙතියාගල රජමහ විහාර පරිශ්‍රයට පැමිණිය හැකිය.

අනුරාධපුර යුගයේ ආරම්භ ව ඇති පෙතියාගල විහාරයෙහි පොළොන්නරු යුගයේ දී ද, අවසන් වරට මහනුවර යුගයේ දී ද රාජානුග්‍රහය යටතේ විහාර කර්මාන්ත සිදුව තිබේ. මහනුවර යුගයේ පටන් භික්ෂූන් වැඩසිටින මෙම විහාරය අයත් වන්නේ 'දරමිටිපොළ සඟ පරපුර' යැයි ප්‍රකට වැලිවිට සරණංකර සඟරජ මාහිමියන්ගේ ද්විතීය ශිෂ්‍ය දරමිටිපොළ ධර්මරක්ෂිත මහනාහිමියන්ගේ ශිෂ්‍යානු ශිෂ්‍ය පරපුරට ය.

විහාරයට පැමිණෙන සැදැහැවතුන්ගේ මෙන්ම පර්යේෂකයන්ට ද අඛණ්ඩ විහාර ඉතිහාසයක් හඳුනාගැනීමට පහසුකම් නොතිබීම ගැටලුවකි. පෙතියාගල රජමහ විහාරයේ ඉතිහාසය පිළිබඳ මෙතෙක් ප්‍රාමාණික අධ්‍යයනයක් සිදුව නොතිබීම ඊට හේතුවයි. ඒ අනුව විහාර ඉතිහාසය ක්‍රමානුකූලව පෙළගැස්වීමත් එයින් සාකච්ඡාවක් ගොඩනැංවීමත් මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණයි. විහාර ඉතිහාසයට සම්බන්ධ අප්‍රකට මෙන්ම අප්‍රකාශිත ලේඛන හඳුනාගැනීමත්, ඒ ඔස්සේ ඓතිහාසික තොරතුරු තවදුරටත් සනාථ කිරීම තවත් අරමුණකි.

## 2. ක්‍රමවේදය

සාහිත්‍යය මූලාශ්‍රය අධ්‍යයනය, ක්ෂේත්‍ර අධ්‍යයනය හා සම්මුඛ සාකච්ඡා ක්‍රමය පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් යොදාගන්නා ලදී. ඒ යටතේ පෙතියාගල රජමහ විහාරය පිළිබඳ තොරතුරු අන්තර්ගත *මහාවංසය* හා ශිලාලේඛන සංග්‍රහය යන ප්‍රාථමික සාහිත්‍ය මූලාශ්‍රය ද, සී.ඩබ්ලිව්. නිකලස් ගේ *Historical Topography of Ancient and Medieval Ceylon* කෘතිය ඇතුළු ද්විතීයික මූලාශ්‍රය ගණනාවක් පරිශීලනය කරන ලදී. ක්ෂේත්‍ර අධ්‍යයනය යටතේ විහාර පරිශ්‍රය මෙන්ම ඒ අවට ප්‍රදේශයේ ගවේෂණය කොට විසිරී තිබෙන ස්මාරක පිළිබඳ තොරතුරු එහිදී වාර්තා කරන ලදී. සම්මුඛ සාකච්ඡා ක්‍රමය යටතේ විහාරාධිපති පොතුවිල විමලඤාණ නාහිමියන් සහ යාබද විහාරස්ථානය වූ නාගොල්ල රජමහ විහාරාධිපති ගනේගොඩ රතනජෝති නාහිමියන්ගෙන් විහාරය සම්බන්ධ තොරතුරු ලබාගන්නා ලදී. මේ ආකාරයට ලබාගත් තොරතුරු ප්‍රාථමික මූලාශ්‍රය හා ද්විතීයික මූලාශ්‍රය සමග සසඳා බලමින් විහාරයේ ඉතිහාසය ගොඩනගා ගැනීමේ අවකාශය උදාවිය.

## 3. ප්‍රතිඵල හා සාකච්ඡාව

### 3.1 විහාර නාම ප්‍රභවය

'පෙතියාගල' යන නාමය සකස් වී ඇත්තේ විහාරයට යාබදව පිහිටි 'පෙතියා වල' නම් ජලයෙන් පිරී ඇති විශාල ගල්වල හේතුවෙන් බව කියැවේ. හක්වටුනා ඔයේ ජලයෙන් පෝෂණය වන පෙතියා වල කිසි දිනෙක නොසිඳෙන බව ගම්වාසීන්ගේ විශ්වාසයයි.[1] විහාර පරිශ්‍රයේ ඇති ලෙන් කිහිපයකටම සමීපයෙන් මෙකී පෙතියා වල පිහිටා ඇති හෙයින් අතීතයේ මෙහි වැඩසිටි භික්ෂූන්ගේ ජල අවශ්‍යතා සඳහා එය භාවිත වන්නට ඇතැයි පිළිගත හැකිය (ඡායාරූපය 01).

මෙහි පෙතියා මාළු බහුලව සිටි හෙයින් පෙතියා වල නමින් හඳුන්වා තිබෙන අතර ඒ නිසා එය සමීපයේ පිහිටි විශාල ගිරිකුළට පෙතියාගල යන නාමය ව්‍යවහාර වූ බව කියැවේ.[2] ඒ බව ඓතිහාසිකව ද සනාථ වන්නේ පොළොන්නරුවේ මහා විජයබාහු රජතුමා විසින් ඉදි කරවන ලද විහාර නාමාවලියේ එන 'පාඨීන විහාරය', පෙතියාගල පුරාණ රජමහ විහාරය යැයි සී.ඩබ්ලිව්. නිකොලස් පළ කරන අදහසකට අනුව ය.[3] පෙතියා මාලුවා සඳහා පාලි භාෂාවෙන් ව්‍යවහාර වන්නේ 'පාඨීන' යන්නයි.[4] ඒ අනුව මෙම විහාරය ගිරිකුළක් ඇසුරු කොටගෙන පවතින හෙයින් පාලියෙන් ව්‍යවහාර වූ 'පාඨීනගිරි' හෝ 'පාඨීනපබ්බත' යන

---

[1]. පුද්ගල සම්ප්‍රේෂණ - පෙතියාගල රජමහ විහාරාධිපති පූජ්‍ය පොතුවිල විමලඤාණ හිමි

[2]. එම

[3]. '…Vijayabāhu I (1055-1110) restored Pāṭhina Vihāra, present *Peṭiyāgala* Vihāra, 3 miles south of Polpitigama, a pre-Christian site. Other pre-Christian temples with inscriptions in this vicinity are *Talpiṭiyāva* Vihāra and *Nāgolla* Vihāra….' Nicholas, C.W. (1963), *Historical Topography of Ancient and Medieval Ceylon JRAS-CB*, Royal Asiatic Society Ceylon Branch, Colombo, p. 100

[4]. *පාලි-සිංහල ශබ්දකෝෂය* (1965), සුමංගල හිමි, මඩිතියවෙල (සම්.), ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, පි. 365



JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

නාමය සිංහලයට පෙරළීමේදී පෙතියාගල වන්නට ඇති බව පිළිගත හැකිය.



**ඡායාරූපය 01. පෙතියා වල**



**ඡායාරූපය 02. කුටියක් ඉදිකර තිබූ බවට සාධක හමුවන කටාරම සහිත ලෙනක්**



**ඡායාරූපය 03. කැටයම් රහිත මුරගලක්**

## 3.2 විහාරයේ ඉතිහාසය

අනුරාධපුර රාජධානි සමයේ මෙම ප්‍රදේශය ආශ්‍රිතව කෘෂිකාර්මික කටයුතු සඳහා ජලය ලබාගැනීමට ඉදි කරන ලද හක්වටුනාව, තලකොළවැව ආදී වාරිකර්මාන්ත රැසක් පිහිටා තිබේ. ජනාකීර්ණ ජනාවාස ගණනාවක් පැවති මෙම ප්‍රදේශයේ කුඩා කඳුගැටවල පිහිටි ගල්ලෙන් ආශ්‍රිතව භික්ෂූන් වහන්සේලාට වැඩසිටීම සඳහා විහාර ඉදිවන්නේ භෞතික දියුණුව පමණක් නොව අධ්‍යාත්මික දියුණුව ද ජනතාව අපේක්ෂා කිරීම හේතුවෙනි. ඒ යටතේ ඉදි කරවන ලද විහාර අතර නාගොල්ල, නියඳවනේ, කබල්ලැලෙන, කොඩිගල, නයින්දනාව, සහ පෙතියාගල ආදී විහාරස්ථාන ප්‍රධාන වේ. මෙම විහාර කර්මාන්ත සඳහා ප්‍රදේශයේ ප්‍රභූවරු සහ ජනතාවගේ සහයෝගය හිමිවූ බව ඉහත සඳහන් විහාරස්ථානවල කටාර සමීපයෙන් හමුවන සෙල්ලිපි ඇසුරෙන් පැහැදිලි වේ.

අනුරාධපුර යුගයේ මුල් භාගයේ භික්ෂූන් වැඩසිටි ආරාමයක් වශයෙන් හඳුනාගත හැකි පොල්පිතිගම නාගොල්ල විහාරයටම අයත් ආරාමික ප්‍රදේශයක් ලෙස පෙතියාගල විහාරය සංවර්ධනය වී ඇති බව හඳුනාගත හැකිය. වර්තමානයේ මෙම විහාර දෙක අතර කිලෝ මීටර එකහමාරකට ආසන්න දුරක් පැවතිය ද, අතරමැද කලාපයේ කටාර සහිත ගල්ලෙන්, ජන්තාඝර, පධානඝර ආදිය පැවතීම මීට ප්‍රධාන හේතුවයි.

කටාර සහිත ගල්ලෙන් දහය අතරින් ප්‍රධාන ලෙන් විහාරය පිහිටි ලෙනේ පමණක් පූර්ව බ්‍රාහ්මී සෙල්ලිපියක් දැකගත හැකිය. එහි සඳහන් වන්නේ 'පරුමක ශුමන පුත සොමදතහ ලෙණ අගත අනගත චතුදිශ ශගශ' එනම්, පරුමක ශුමනගේ පුත්‍ර සෝමදත්තගේ ලෙන පැමිණි නොපැමිණි සංඝයාට යන්නයි.[5]

[5]. '…Peṭiyāgala, about a mile from No. 40 Inscription (No. 40 Kabaella lena at Dāgama) over the roof of the temple : Parumaka Sumana putha Somadataha lene….' Műller, Edward (1984), *Ancient Inscriptions of Ceylon*, Asian Educational Services, New Delhi, p. 36; 'Parumuka-Śumana-puta-Śomadataha lene agata-anagata catu-diśa-śagaśa, The Cave of Somadatta, son of the Chief Sumana, [is given] to the Sańgha.' *Inscriptions of Ceylon* Vol. I (1970),


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

පොල්පිතිගම නාගොල්ල රජමහ විහාර පරිශ්‍රයෙන් ද 'පරුමක ශුමන පුතන පස බතිකන ලෙනෙ' යනුවෙන් සඳහන් ලෙන්ලිපියක් හමු වේ. එයින් පරුමක සුමනගේ පුතුන් පස්දෙනාගේ ලෙන යන්න අරුත් දෙයි.[6] මෙයින් පැහැදිලි වන්නේ එකල මෙම ප්‍රදේශයේ විසූ සුමන නම් ප්‍රධානියාගේ පුත්‍රයන් විසින් පෙතියාගල සහ නාගොල්ල යන විහාර පිහිටි ආරාම සංකීර්ණය සඳහා අනුග්‍රහ දක්වන්නට ඇති බවයි. සුමනගේ පුතුන් පස්දෙනා වූයේ සෝමදත්ත, අශෝක, මහාතිස්ස, උතරී සහ ඉන්දභූත බව අවට ප්‍රදේශ කිහිපයකින් හමුවන ලෙන්ලිපි ආශ්‍රයෙන් හඳුනාගෙන තිබේ.[7]

පෙතියාගල ප්‍රධාන ලෙන් විහාරය පිහිටි ලෙනට අමතරව කටාරම් සහිත තවත් ලෙන් කිහිපයකම කුටි ඉදිකර තිබූ බවට සලකුණු පවතී. මීට අමතරව විහාර පරිශ්‍රයේ මතුපිට තිබී පැන්පාත්‍ර, වැසිකිළි ගල්, කැසිකිළි ගල්, බුද්ධ ප්‍රතිමා පිහිට වූ පාදම් කිහිපයක් සහ ගොඩනැගිලි සඳහා භාවිත කරන ලද බොරදම් සහිත ශිලා පුවරු කිහිපයක් හමුව තිබේ. මේ අතර කැටයම් රහිත මුරගල් සහ කැටයම් රහිත කොරවක්ගල් කිහිපයකි.

මෙයින් පැහැදිලි වන්නේ අනුරාධපුර යුගයේ මුල්භාගයේ පටන්ම මෙම ස්ථානය කේන්ද්‍ර කොටගෙන විහාරයක් පැවති බවයි. මේ හැරෙන්නට වනයෙන් වැසුණු ප්‍රදේශයේ ද ආරාමික නටබුන් රැසක් දැකගත හැකිය.

පොළොන්නරු යුගයේදී ද පෙතියාගල විහාරයට රාජානුග්‍රහය හිමි වූ බව සනාථ වන්නේ මහා විජයබාහු රජතුමා විසින් කරවන ලද විහාර කර්මාන්ත අතර එන 'පාඨීන විහාරය',[8] පෙතියාගල බවට *Historical Topography of Ancient and Medieval Ceylon* කෘතියෙන් සී.ඩබ්ලිව්. නිකොලස් පෙන්වාදීම හේතුවෙනි.[9] පෙතියා මාලුවා සඳහා පාලි භාෂාවෙන් 'පාඨීන' යනුවෙන් ව්‍යවහාර කෙරේ. විහාර භූමියට යාබදව පිහිටි පෙතියා මාළු පිරි ගල්වළ, ගිරිකුළක් ඇසුරු කොටගෙන පවතින හෙයින් මෙම විහාරයට පාලියෙන් 'පාඨීනගිරි' හෝ 'පාඨීනපබ්බත' ලෙසත්, සිංහලයෙන් පෙතියාගල ලෙසත් ව්‍යවහාර වූ බව පිළිගත හැකිය.



ඡායාරූපය 04. ප්‍රතිමා පාදම් සහ පැන් පාත්‍ර



ඡායාරූපය 05. සිරිපතුල් ගලක්

**මහාවංසයේ** සඳහන් තොරතුරුවලට අනුව මහා විජයබාහු රජතුමා ප්‍රතිසංස්කරණය කළ විහාර සියල්ලම පාහේ ඒ කාලය වන විට දිරාපත්ව තිබූ හෙයින් රජතුමා විසින් ඒවායේ නඩත්තුවට ගම්වර පූජා කිරීම ද සිදු

Paranavitana, S. (ed. & tr.), Department of Archeology, Colombo, p. 76

6. *Inscriptions of Ceylon* Vol. I (1970), p. 76

7. රතනජෝති නාහිමි, ගනේගොඩ, *සැඟවුණ පුදබිමක පුරාවෘත්තය - පොල්පිතිගම නාගොල්ල රජමහ විහාරය* (අප්‍රකාශිත කෘතිය), පි. 14

8. '...පණ්ඩවාපි ච පාඨීනො රක්ඛචෙතියපබ්බතො....ඉච්චේව'මාදයො නෙක විහාරෙ ච බහු විභූ පටිසංඛරී ජිණ්ණෙ සො ගාමෙ චා'දා විසුං විසුං....' *උත්ත පූරණො සහිතො මහාවංසො* (1959), බුද්ධදත්ත හිමි, පොල්වත්තේ (සංස්.), ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 58 පරි. 58-63 ගාථා; '...පඬාවිය ද පාඨීන වෙහෙර ද ඌරුවෙල නම් වෙහෙර ද දෙව් මඬල ගිරිය ද මීගොඩ වෙහෙර ද...මේ ආදී වූ දිරූ නොයෙක් විහාරයන් ඒ රජ තෙම ප්‍රතිසංස්කරණය කරවී. වෙන් වෙන් වසයෙන් ගම් ද දුන්නේ ය....' *සිංහල මහාවංසය* (1994), සුමංගල හිමි, හික්කඩුවේ සහ දේවරක්ෂිත, බටුවන්තුඩාවේ (පරි.), රත්න ප්‍රකාශකයෝ, කොළඹ, 60 පරි. 59-64 ගාථා

9. '...Vijayabāhu I (1055-1110) restored Pāṭhina Vihāra, present *Peṭiyāgala* Vihāra, 3 miles south of Polpitigama, a pre-Christian site. Other pre-Christian temples with inscriptions in this vicinity are *Talpiṭiyāva* Vihāra and *Nāgolla* Vihāra...' Nicholas, (1963), p. 100



JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

කරනු ලැබ තිබේ. මෙයින් පැහැදිලි වන්නේ පෙතියාගල විහාරය, පොළොන්නරු යුගය ආරම්භ වන විට කිසියම් පරිහානි තත්ත්වයකට පත්ව තිබෙන්නට ඇති බවයි. එහෙත් රජතුමාගේ මැදිහත්වීමෙන් සිදු වූ ප්‍රතිසංස්කරණ කටයුතු සහ ගම්වර ප්‍රදානයෙන් පසුව පෙතියාගල විහාරයේ කටයුතු මැනවින් සිදු කරගෙන යාමට විහාරවාසී භික්ෂූන්ට අවකාශ උදාවන්නට ඇත.

ඉහතින් සඳහන් කළ ආකාරයට පෙතියාගල විහාරය සම්බන්ධ නාගොල්ල ආරාම සංකීර්ණයේ මතුපිට ගවේෂණවලදී පැරණි මැටි බඳුන්වල කොටස් රාශියක්, ලීලාවතී රාජ්‍ය සමයට (ක්‍රි.ව. 1197-1200, 1209-1210, 1211-1212) අයත් තඹ මස්සක් (තඹ කාසියක්) හමුවීම සහ දොළොස්වන සියවසට අයත් සෙල්ලිපියක් හමුවීම[10] හේතුවෙන් පොළොන්නරු යුගයේදී පෙතියාගල විහාරය සම්බන්ධ නාගොල්ල විහාරය ද බොහෝ භික්ෂූන් වැඩසිටි ආරාමික ප්‍රදේශයක් බව පෙනෙන්නට තිබේ.

පොළොන්නරු යුගයෙන් පසුව පෙතියාගල විහාරය පිළිබඳ තොරතුරු විරල ය. එහෙත් පොළොන්නරු රාජධානියෙන් අනතුරුව ඇති වූ දඹදෙණිය, යාපහුව සහ කුරුණෑගල යන රාජධානි පෙතියාගල ප්‍රදේශයට සමීප හෙයින් මෙම ප්‍රදේශය සම්පූර්ණයෙන්ම අත්නොහළ බව පිළිගත හැකිය.

### 3.3 නූතන ප්‍රබෝධය

පෙතියාගල විහාරයේ නූතන ප්‍රබෝධය ඇරඹෙන්නේ මහනුවර යුගයේදී ය. තත් යුගයේදී පෙතියාගල ඇතුලු පොල්පිතිගම අයත් වූයේ සත් කෝරළ මහදිසාවට ය. කන්ද උඩරට රාජධානියේ ප්‍රධාන දිසාවනි සතරෙන් එකක් වූ සත් කෝරළ මහදිසාව රජතුමාට ආදායම් උපදවන ලද වැදගත් ප්‍රදේශයක් බව හඳුනාගත හැකිය. සත් කෝරළයේ ජනතාව සෙංකඩගල අගනුවර සමග පවත්වන ලද විවිධ සබඳතා සහ දැනහැඳුනුම්කම්වල ප්‍රතිඵලයක් වශයෙන් මල්වතු අස්ගිරි උභය මහාවිහාරවල පැවිද්ද ලබාගැනීමට මෙම ප්‍රදේශයේ කුලදරුවන් කටයුතු කළ බව හඳුනාගත හැකිය. පසුව මල්වතු සහ අස්ගිරි මහාවිහාර පාර්ශ්වයේ මහානායක, අනුනායක ආදී ප්‍රධාන පදවි හෙබවීමට ද සත් කෝරළයේ උපන් භික්ෂූන් වහන්සේලාට හැකිව තිබේ.[11] උන්වහන්සේලාගේ මූලිකත්වයෙන්, උපන් ගම්බිම්වල පිහිටි වෙහෙරවිහාරවල ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ වූ බවට නිදසුන් රැසකි. ඒ යටතේ පෙතියාගල විහාරයේ ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ වන්නේ මල්වතු මහාවිහාර පාර්ශ්වයේ අනුනායකව වැඩසිටි පොල්පිතිගම ශ්‍රී සිද්ධාර්ථ අනුනාහිමියන්ගේ පුරෝගාමීත්වයෙනි.

පොල්පිතිගම ග්‍රාමයේ උපන් උන්වහන්සේ ඓතිහාසික රිදීවිහාරයේදී පැවිදි බිමට පත්වූයේ වැලිවිට ශ්‍රී සරණංකර සඟරජ මාහිමියන්ගේ ප්‍රධාන ශිෂ්‍යවර සහ මල්වතු මහාවිහාර පාර්ශ්වයේ ප්‍රථම මහානායක

---

[10]. රතනජෝති නාහිමි (අප්‍රකාශිත කෘතිය), පි. 23-24

[11]. සත් කෝරළයේ උපත ලැබූ ස්‍යාමොපාලි මහානිකායේ මල්වතු මහාවිහාර පාර්ශ්වයේ මහානායක හිමිවරු - දරමිටිපොළ ශ්‍රී ධර්මරක්ඛිත මහනාහිමි, කොටිකාපොළ ශ්‍රී සෝභිත මහනාහිමි, කන්දේගෙදර ශ්‍රී රේවත මහනාහිමි, ගල්ගිරියාවේ ශ්‍රී සුමංගල මහනාහිමි, පරකුඹුරෙ ශ්‍රී විපස්සි මහනාහිමි, මැදගම ශ්‍රී දේවමිත්ත මහනාහිමි, ගල්ගිරියාවේ ශ්‍රී බුද්ධරක්ඛිත මහනාහිමි, පහමුණේ ශ්‍රී සුමංගල මහනාහිමි.

අනුනායක හිමිවරු - කොටිකාපොළ ශ්‍රී රතනජෝති නාහිමි, පොල්පිතිගම ශ්‍රී සිද්ධාර්ථ නාහිමි, කටුපොත නාහිමි, බොරවැවේ ශ්‍රී ධම්මපාල නාහිමි, කොටිකාපොළ ශ්‍රී සෝභිත නාහිමි, දෙහිකුඹුරේ නාහිමි, වත්තේගෙදර ශ්‍රී දේවමිත්ත නාහිමි, කන්දේගෙදර ශ්‍රී රේවත නාහිමි, පරකුඹුරේ ශ්‍රී විපස්සි නාහිමි, තිඹිරිවැවේ ශ්‍රී විපස්සි නාහිමි, හුලව ශ්‍රී බෝධිසීහ නාහිමි, වටරැක ශ්‍රී සෝභිත නාහිමි, අනුක්කනේ ශ්‍රී සරණංකර නාහිමි, හුළුගල්ලේ ශ්‍රී මේධංකර නාහිමි, පහමුණේ ශ්‍රී ගුණානන්ද නාහිමි

අස්ගිරි මහාවිහාර පාර්ශ්වයේ මහානායක හිමිවරු - ඉඳවලුගොඩ ශ්‍රී ධම්මපාල මහනාහිමි, පොතුහැර ශ්‍රී රතනපාල මහනාහිමි, මාවතගම ශ්‍රී සෝභිත මහනාහිමි, යටන්වල ශ්‍රී සුනන්ද මහනාහිමි, කොටගම ශ්‍රී ගුණරතන මහනාහිමි, උඩුමුල්ලේ ශ්‍රී රතනජෝති මහනාහිමි, අඹගස්වැවේ ශ්‍රී ධම්මපාල මහනාහිමි, උඩුගම ශ්‍රී රතනපාල මහනාහිමි, උඩුගම ශ්‍රී බුද්ධරක්ඛිත මහනාහිමි

අනුනායක හිමිවරු - ඉඳවලුගොඩ ශ්‍රී ධම්මපාල නාහිමි, පොතුහැර ශ්‍රී රතනපාල නාහිමි, තුඹගොඩ ශ්‍රී සුමනජෝති නාහිමි, වාරියපොල ශ්‍රී සුමංගල නාහිමි, කොටගම ශ්‍රී ගුණරතන නාහිමි, උඩුමුල්ලේ ශ්‍රී රතනජෝති නාහිමි, කරවිලගල ශ්‍රී ආනන්ද නාහිමි, පැපලේ ශ්‍රී අත්ථදස්සි නාහිමි, ඉඳවලුගොඩ ශ්‍රී ධම්මපාල නාහිමි, වැල්ලව ශ්‍රී අත්ථදස්සි නාහිමි, නිකවල ශ්‍රී බුද්ධරක්ඛිත නාහිමි, උඩුගම ශ්‍රී රතනපාල නාහිමි, උඩුගම ශ්‍රී බුද්ධරක්ඛිත නාහිමි

ගුණානන්ද හිමි, පහමුණේ (2008), 'මහනාහිමිවරු', *කුරුණෑගල ශාස්ත්‍රීය සංග්‍රහය*, සීලක්ඛන්ධ හිමි, තුඹුල්ලේ සහ කරුණාරත්න, ජී. (සංස්.), වයඹ පළාත් සභාව, කුරුණෑගල, පි. 961-974; සුමංගල හිමි, පහමුණේ (2008), 'අනුනාහිමිවරු', *කුරුණෑගල ශාස්ත්‍රීය සංග්‍රහය*, සීලක්ඛන්ධ හිමි, තුඹුල්ලේ සහ කරුණාරත්න, ජී. (සංස්.), වයඹ පළාත් සභාව, කුරුණෑගල, පි. 984-993


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ බුද්ධරක්ෂිත මහනාහිමියන්ගේ ශිෂ්‍යයකු වශයෙනි. ඉගෙනීමේ විශේෂ දක්ෂතා දැක්වූ සිද්ධාර්ථ හිමියන් එය කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා (1747-1782) ඉදිරියේ ප්‍රකට කරන ලද බවත්, ගුණ නුවණින් යුතු සිල්වත් භික්ෂුවක් වූ උන්වහන්සේ බුද්ධරක්ෂිත මහනාහිමියන්ගේ ප්‍රධාන ශිෂ්‍යයා වූ බවත් *සංඝරාජ සාධු චරියාවේ* සඳහන් වන්නේ මෙසේ ය;

> ...සකල ශාසනාභිවෘධියෙහි මහෝපකාරීව ලංකා වර්ධනය කර වදාරන කීර්ති ශ්‍රී රාජසිංහ මහාරාජොත්තමයන්ටත් ඔප්පු කර තමන් වහන්සේට (තිබ්බටුවාවේ බුද්ධරක්‍ෂිත සිද්ධාර්ථ නායක සාමි) අනුව ශ්‍රී මුඛ පාලි සඟි අටුවාදිය තෝරා කීමෙහි අභිනව ප්‍රබන්ධ ඉපදවීමෙහි රාජරාජ මහාමාත්‍ය මහා ස්ථවිරාදි මහ පිරිස් මැද සභාරඤ්ජනය කොට ධර්‍ම කථනයෙහි බුහුටි කර වූ තමන් වහන්සේගේ ශිෂ්‍ය සමාගමට ප්‍රධාන වූ සාධාරණ ගුණ නුවණ යහපත් ගති ඇති පොල්පිටිගම සිධාර්‍ථ ශිෂ්‍ය වූ උන්නාන්සේට...[12]

මූලික අධ්‍යාපනය කටයුතු නිමකිරීමෙන් අනතුරුව පොල්පිතිගම සිද්ධාර්ථ හිමියන් විසින් සඟරජ මාහිමියන්ගේ සහ තමන්වහන්සේගේ ආචාර්ය හිමියන්ගේ උපදෙස් පරිදි පූජාපිටිය ආසන්නයේ පිහිටි මාරතුගොඩ නම් ග්‍රාමයට වැඩම කරන්නේ සියම් උපසම්පදාවෙන් ඇති කළ ශාසනික ප්‍රබෝධය ගම් නියම්ගම් පුරා ව්‍යාප්ත කිරීමේ අභිලාෂයෙනි. මුල්කාලීනව ගණින්නාන්සේලාට අයත්ව තිබූ මාරතුගොඩ විහාරය කේන්ද්‍ර කොටගෙන ශාසනික ප්‍රබෝධයක් ඇති කිරීමට සිද්ධාර්ථ හිමියන්ට හැකි වූ බව කියැවේ. උන්වහන්සේ ඇවෑමෙන් එහි වැඩසිටි කොටුවේගෙදර සෝණුත්තර හිමියන් ප්‍රධාන ශිෂ්‍යානුශිෂ්‍ය පරපුර ද එම කටයුතු අඛණ්ඩව සිදු කරනු ලැබ තිබේ. 'මාරතුගොඩ විදුමිණ පිරිවෙන' නම් වර්තමානයේදී ප්‍රකට විද්‍යාස්ථානය වර්ෂ 1969 දී ආරම්භ වූයේ ද මෙම විහාරය මුල්කොටගෙන ය.[13]

[12]. *සංඝරාජ සාධු චරියාව* (1997), විමලවංස හිමි, අකුරටියේ සහ සෙනෙවිරත්න, නාගොඩ ආරියදාස (සංස්.), සමයවර්ධන ප්‍රකාශන, කොළඹ, පි. 25

[13]ඥාණරතන හිමි, කිරිඳිගල්ලේ (2019), 'මාරතුගොඩ විදුමිණ පිරිවෙනට 50 වසරයි', *දිනමිණ*, පෙබරවාරි 25

කාර්යශූර එමෙන්ම නොපසුබට උත්සහයෙන් යුතුව සුවිසල් ශාසනික සේවාවක් සිදු කළ සිද්ධාර්ථ හිමියන් වහන්සේ වර්ෂ 1773 දී රිදීවිහාරය ඇතුලු විහාර ගණයේ අධිපති ධුරයට පත්වන්නේ තමන්වහන්සේගේ ආචාර්යවරයා වූ බුද්ධරක්ෂිත මහනාහිමියන්ගේ අපවත්වීමත් සමග ය. බුද්ධරක්ෂිත මහනාහිමියන් අපවත්වීමට පෙරාතුව සිද්ධාර්ථ හිමියන්ට සියලු වගකීම් පවරා දෙන ලද බව *සංඝරාජ සාධු චරියාවේ* දක්වෙන්නේ මෙසේ ය.

> ....පොල්පිටිගම සිධාර්‍ථ ශිෂ්‍ය වූ උන්නාන්සේට යථොක්ත පොත් හා ශිෂ්‍ය සමාගමත් රිදීවිහාරාදියත් රක්ෂා කරගෙන සිටින ලෙසට සාධාරණ ගුණ නුවණ කියා කර දෙමින් නිමවා, කිසියම් රෝගයකින් මල්වත්තේ විහාරෙ තමන් වහන්සේගේ ලැගුම් ගෙහිදී සංඝරාජොත්තම සාමිදරුවන් ප්‍රමුඛ එම පොල්පිටිගම සිධාර්‍ථාදී ස්වකීය ශිෂ්‍ය ගණයා හා ගිනිගත්පිටියේ සංඝරක්ඛිත ස්ථවිරාදී විශ්වාස සංඝයා මධ්‍යයෙහිදී කාලක්‍රියා කළායින් පසුව....ඒ මෘත දේහය රිදී විහාරෙටම ගෙනගොස් ආදාහනය කොට දාගොබ බඳවා තිබ්බොටුවාවේ සිධාර්‍ථ කුඩා උන්නාන්සේ ඇතුලු වූ ශිෂ්‍ය සමාගම පරිහරණය කිරීමෙන් පොල්පිටිගම සිධාර්‍ථ උන්නාන්සේ රිදීවිහාරෙ පොරොත්තුව නියම වූ ලෙසින්ම සිටිනවාය....[14]

තමන්වහන්සේට ආචාර්ය පරපුරෙන් උරුම වූ වගකීම් මෙන්ම ශාසනික මෙහෙවර ද අඛණ්ඩව සිදු කරන ලද සිද්ධාර්ථ හිමියන් පසුකලෙක මල්වතු මහාවිහාර පාර්ශ්වයේ අනුනායක පදවියට පත්වූහ.[15] වර්ෂ 1779දී රචනා කරන ලද *සංඝරාජ සාධු චරියාවේ* [16] 'පොල්පිටිගම සිද්ධාර්ථ උන්නාන්සේ' නමින් ද, වර්ෂ 1798 නිකුත් කරන ලද නාගොල්ල රජමහ විහාර සන්නසේ 'පොල්පිටිගම සිද්ධාර්ථ අනුනායක උන්නාන්සේ' නමින් ද සිද්ධාර්ථ හිමියන් හඳුන්වන

[14]*සංඝරාජ සාධු චරියාව* (1997), පි. 25

[15]විමලබුද්ධි ස්ථවිර, වල්ගොව්වාගොඩ, විජිතසිරි ස්ථවිර, නියංගොඩ හා සෙනෙවිරත්න, අනුරාධ (1992), *මල්වතු මහාවිහාර සංඝ පරම්පරාව (අනුනායක පදවිය)*, බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව, කොළඹ, පි. 8

[16]සන්නස්ගල, පුඤ්ඤිබණ්ඩාර (2013), *සිංහල සාහිත්‍ය වංශය*, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, පි. 499


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

හෙයින් වර්ෂ 1779 හා 1798 අතර කාලවකවානුවේදී උන්වහන්සේ අනුනායක පදවියට පත්වන්නට ඇත. එවකට මල්වතු මහාවිහාර පාර්ශ්වයේ මහානායක පදවිය උසුලන්නට ඇත්තේ දරමිටිපල ශ්‍රී ධර්මරක්ඛිත මහානාහිමියන් (1774-1787) හෝ රාජගුරු මොරතොට ශ්‍රී ධම්මක්ඛන්ධ මහනාහිමියන් (1787-1811) විසිනි.[17]

තමන්වහන්සේ උපන් ප්‍රදේශයේ පිහිටි පැරණි විහාරයක් වූ නාගොල්ල විහාරය පිළිබඳ සිද්ධාර්ථ අනුනාහිමියන්ගේ අවධානය යොමුවනනට ඇත්තේ මෙම කාලසීමාවේදී ය. ඓතිහාසික වශයෙන් වැදගත් එවන් විහාරයක් ජරාවාසව පැවතීම සිදු නොවිය යුත්තක් සේ සලකා උන්වහන්සේ විසින් නාගොල්ල විහාරයේ එක් ලෙනක ශෛලමය බිත්ති බඳවා, බුද්ධ ප්‍රතිමා සහ දේව ප්‍රතිමා නිර්මාණය කොට, පිටත බිත්තිවල වෙස්සන්තර ජාතකය ආදී සිතුවම්වලින් අලංකෘත කොට කරන ලද බව නාගොල්ල රජමහ විහාර සන්නසේ සඳහන් වේ.

ඒ සමගම සිද්ධාර්ථ අනුනාහිමියන් විසින් නාගොල්ල විහාරයට යාබදව පිහිටි පෙතියාගල විහාරයේ ද බුද්ධ ප්‍රතිමා තුන් නමක් සහිතව චිත්‍රවලින් අලංකෘත ලෙන් විහාරයක් කරවා විහාරද්වයේ නේත්‍රා ප්‍රතිෂ්ඨාපන මංගල්‍ය පවත්වන ලද බව නාගොල්ල රජමහ විහාර සන්නසේ වැඩිදුරටත් සඳහන් වේ.

විහාර කර්මාන්ත නිමවීමෙන් පසුව සිද්ධාර්ථ අනුනාහිමියන් විසින් නාගොල්ල සහ පෙතියාගල විහාර මුල්කොටගෙන සිදු කරන ලද පින්කම් පිළිබඳ ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමාට සැලකිරීමත් සමග ප්‍රසාදයට පත් රජතුමා වර්ෂ 1798දී විහාර දෙකට එක් තඹ සන්නසකින් ගම්වර පූජා කිරීම පිළිබඳ නාගොල්ල රජමහ විහාර සන්නසේ සඳහන් වේ .

ඓතිහාසික රිදීවිහාර සඟ පරපුරට සම්බන්ධ පොල්පිතිගම ශ්‍රී සිද්ධාර්ථ නාහිමියන්ගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරපුර ප්‍රදේශ කිහිපයක විසිර පවතී. ඒ අතරින් මාතලේ ප්‍රදේශයට වැඩම කළ උන්වහන්සේගේ ශිෂ්‍ය දුනුකේවත්තේ හිමියන්ගෙන් ඇරඹුණු දුනුකේවත්ත සඟ පරපුරට අමතරව මාතලේ ප්‍රදේශයේ ව්‍යාප්තව තිබෙන උකුවෙල නාගොල්ල සඟ පරපුර, මාතලේ වේරගොඩ සඟ පරපුර සහ නිකකොටුවේ සුසීමාරාම සඟ පරපුර සිද්ධාර්ථ නාහිමියන්ගේ ශිෂ්‍යයන්ගෙන් ආරම්භ වූ බව පිළිගැනේ.[18]



ඡායාරූපය 06. නාගොල්ල රජමහ විහාරස්ථ ලෙන් විහාරයේ ඇති පොල්පිතිගම ශ්‍රී සිද්ධාර්ථ අනුනාහිමියන්ගේ යැයි සැලකෙන සිතුවම

සිද්ධාර්ථ අනුනාහිමියන් අවසන් කාලසීමාවේදී නාගොල්ල රජමහ විහාරයේ වැඩසිටින්නට ඇතැයි විශ්වාස කළ හැක්කේ උන්වහන්සේගේ භෂ්මාවශේෂ තැන්පත් කොට තැනුණු කුඩා සෑයක් නාගොල්ල විහාර පරිශ්‍රයේ දැකගත හැකි හෙයිනි. උන්වහන්සේගෙන් ඇරඹුණු නාගොල්ල සඟ පරපුර මෙන්ම නාගොල්ල සහ පෙතියාගල රජමහ විහාරද්වයේ අධිපති ධුරය පිළිවෙලින් කැකුණාවේ සරණංකර, පොල්පිතිගම

[17]පියදස්සි ස්ථවිර, නැහිනිවෙල (2004), 'මල්වතු මහාවිහාරීය මහානායක පරපුර', *මල්වතු මහා විහාරය සහ මහ පදවිය* - අතිගෞරවාර්හ තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගල මහනාහිමි උපහාර ලිපි සංග්‍රහය, විමලබුද්ධි ස්ථවිර, වල්ගොව්වාගොඩ, විජිතසිරි ස්ථවිර, නියංගොඩ හා ධම්මරක්ඛිත ස්ථවිර, කුළුගම්මන ඇතුලු තවත් අය (සංස්.), මධ්‍යම සංස්කෘතික අරමුදල, කොළඹ, පි. 295

[18]සෝමරතන හිමි, ඇරැවුල (1984), 'මාතලේ දිසාවේ සඟ පෙළපත්', *ඓතිහාසික මාතලේ*, සාසනතිලක නාහිමි, මාතලේ, සුමනජෝති නාහිමි, පරණගම හා නන්දාරාම හිමි, තිස්මඩ ඇතුලු තවත් අය (සංස්.), මාතලේ දිසා සංස්කෘතික මණ්ඩලය, මාතලේ, පි. 138-140, 150-151


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

සුදස්සි සහ පොල්පිතිගම ධම්මරතන යන හිමිවරුන් යටතේ පැවතිණි.[19]

### 3.4 පෙතියාගල පුරාණ රජමහ විහාරය නියඳවනේ පුරාණ රජමහ විහාරයට භාරවීම

වර්ෂ 1930දී නාගොල්ල රජමහ විහාරාධිපතිව වැඩසිටි පොල්පිතිගම ගුණානන්ද හිමියන් විසින් පෙතියාගල රජමහ විහාරයේ කටයුතු පවත්වාගෙන යාම සඳහා ඓතිහාසික නියඳවනේ රජමහ විහාරයේ විහාරාධිපතිව වැඩසිටි කම්බුවටවන සරණංකර හිමියන් වෙත පවරාදීමට කටයුතු කරන ලදී.

නියඳවනේ සඟ පරපුරේ ආදිකර්තෘවරයා වශයෙන් සැලකෙන්නේ දරම්ටිපොල ශ්‍රී ධර්මරක්ෂිත මහනාහිමියන් ය. වැලිවිට ශ්‍රී සරණංකර සඟරජ මාහිමියන්ගේ ද්විතීය ශිෂ්‍යවරයා වූ උන්වහන්සේ පසුකලෙක මල්වතු මහාවිහාර පාර්ශ්වයේ මහානායක පදවියට පත්වූහ.[20] ධර්මරක්ෂිත මහානාහිමියන්ගේ ප්‍රධාන ශිෂ්‍යවර සහ මල්වතු මහාවිහාර පාර්ශවයේ අනුනායක පදවිය හෙබවූ බොරවැවේ ශ්‍රී ධම්මපාල අනුනාහිමියන්ට කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා විසින් සන්නසකින් නියඳවනේ පුරාණ රජමහ විහාරය පූජා කරන ලදී. උන්වහන්සේගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරපුර 'නියඳවනේ සඟ පරපුර' නමින් ප්‍රකට විය. ධම්මපාල අනුනාහිමියන් ඇවෑමෙන් බොරවැවේ පියදස්සි, හේරත්ගම ධම්මදස්සි, බොරවැවේ මේධංකර, කම්බුවටවන සිද්ධාර්ථ සහ කම්බුවටවන සරණංකර යන හිමිවරුන් විසින් නියඳවනේ පුරාණ රජමහ විහාරයේ අධිපති ධුරය දරන ලදී.[21]

කම්බුවටවන සරණංකර හිමියන්ගේ අනුශාසනා යටතේ පෙතියාගල රජමහ විහාරයේ භාරකාර ධුරයට පත් කම්බුවටවන මේධංකර හිමියන්ගේ මූලිකත්වයෙන් විහාර සංවර්ධනය උදෙසා අවශ්‍ය මූලික කටයුතු රැසක් සිදු වූ බව හඳුනාගත හැකිය. වර්තමානයේ විහාර පොත්ගුලේ දැකගත හැකි පුස්කොළ පොත් රැසක් සම්පාදනය කරවන ලද්දේ ද උන්වහන්සේ විසිනි.

වර්ෂ 1935දී නියඳවනේ සහ පෙතියාගල පුරාණ රජමහ විහාරද්වයාධිපති ධුරයට පත් බොරවැවේ ශ්‍රී රතනපාල හිමියන් විසින් ඒ වන විට ගරාවැටී තිබූ පෙතියාගල විහාරයේ පුරාණ ස්තූපය පිළිසකර කරවන ලදී. මීට අමතරව උන්වහන්සේගේ මූලිකත්වයෙන් වර්ෂ 1943දී හුඹස් බවට පත්ව තිබූ පෙතියාගල ලෙන් විහාරයේ ප්‍රතිමා අලුත්වැඩියා කරවා ප්‍රධාන බුද්ධ ප්‍රතිමාවට දෙපසින් දෑඅගසව්වන්ගේ ප්‍රතිමා, විෂ්ණු දේව ප්‍රතිමාවක් සහ මෛත්‍රී බෝසතුන්ගේ ප්‍රතිමාවක් ඉදි කොට, විහාරයේ නව සිතුවම් කර්මාන්ත සිදුකොට තිබේ. ඒ බව විහාරයේ බිත්තියක සටහන් කොට ඇත්තේ 'රාජ්‍යවර්ෂ 1943ක් වූ සැප්තැම්බර් මස 1 දින නියඳවනේ පුරාණ රජමහ විහාරාධිපති කර්මාචාර්ය ධුරන්ධර බොරවැවේ ශ්‍රී රතනපාල ස්වාමීන් වහන්සේගේ අනුශාසනා පරිදි සමාධි ප්‍රතිමා ගෘහය ද....' යනුවෙනි.

ඒ වන විට විනාශයට පත්වෙමින් පැවති මහනුවර යුගයේ අඳින ලද සිතුවම් මත නව සිතුවම් අඳිනු ලැබුව ද, පැරණි සිතුවම්වලින් ශේෂ වූ වියන් සැරසිල්ලක් තවමත් ප්‍රධාන බුද්ධ ප්‍රතිමාවේ පිටුපසට වන්නට වියන්තලයේ දැකගත හැකිය.

### 3.5 විහාර අංග හා පුරාවිද්‍යා සාධක

පෙතියාගල රජමහ විහාර පරිශ්‍රයේ ස්තූපය, බෝධිය සහ ලෙන් විහාරය එක පෙළට පිහිටා තිබේ. මෙයින් සෑ මළුව පිහිටා ඇත්තේ විහාර පරිශ්‍රයේ නැගෙනහිර දෙසට වන්නට ය. අඩි 3ක් පමණ උසැති පීඨිකාවක පිහිටි ස්තූපය ඝණ්ඨාකාර හැඩැති ය. සෑ මළුව වටා තැනින් තැන ශිලා පුවරු රැසක් විසිරී තිබේ. ඒ අතර බොරදම් සහිත පුවරු කිහිපයකි.

සෑ මළුවට සහ ලෙන් විහාරයට මැදිව බෝ මළුව පිහිටා තිබේ. ද්විමාලක බෝ මළුව මධ්‍යයේ පැරණි බෝධි වෘක්ෂයකි. මෑතභාගයේදී ඒ වටා අටවිසි බුද්ධ ප්‍රතිමා සහිත ප්‍රාකාරයක් සහ රන් වැටක් බඳවා තිබේ. බෝ මළුව වටා ද බොරදම් සහිත ශිලා පුවරු, ශිලා කුළුණු රැසක් විසිරී තිබේ. මීට අමතරව කැටයම් සහිත කොරවක්ගල් යුගලක් බෝ මළුවට පිවිසෙන පියගැටපෙළ පාමුල දැකගත හැකිය.

[19]රතනජෝති නාහිමි (අප්‍රකාශිත කෘතිය), පි. 40

[20]*සංඝරාජ සාධු චරියාව* (1997), පි. 40-42

[21]සිද්ධත්ථ හිමි, හාතිගමුවේ (1995), 'නියඳවනේ විහාර පාර්ශවය - සඟ පරපුර', *සිරි රතනපාල අභිනන්දන* - බොරවැවේ රතනපාල නාහිමි අභිනන්දන ශාස්ත්‍රීය සංග්‍රහය, අමරමෝලි හිමි, එගොඩමුල්ලේ සහ ඤාණරතන හිමි, වලස්වැවේ (සංස්.), රුවන් බෝධි පිරිවෙන, ගැට්ටුවාන, පි. xxv-xxviii



**ඡායාරූපය 07. බොරවැවේ ශ්‍රී රතනපාල හිමියන් විසින් කරන ලද විහාර කර්මාන්තය**



**ඡායාරූපය 08. දැනට ඉතිරිව තිබෙන මහනුවර යුගයේ වියන් සිතුවමකින් කොටසක්**

විහාර පරිශ්‍රයේ බටහිර දෙසට වන්නට තරමක් උස් මළුවක කටාර සහිත ලෙනක් ඇසුරු කොටගෙන ලෙන් විහාරය පිහිටා තිබේ. අන්තරාලය සහ ගර්භගෘහ දෙකකින් එය සමන්විත වේ. අන්තරාලයේ මලියදේව මහරහතන් වහන්සේ සහ සුළුගුළු උපාසකගේ ද, හාතිගමුවේ සිද්ධත්ථ හිමියන්ගේ ද සිතුවමක් දැකගත හැකිය. අන්තරාලයේ සිට ප්‍රධාන ගර්භගෘහයට පිවිසෙන ද්වාරයට ඉහළින් අලංකාර මකර තොරණකි. ඊට දෙපසින් අසිපත්ධාරී දොරටුපාල ප්‍රතිමා දෙකක් සහ මුව හයාගත් සිංහ රූප දෙකක් මූර්තිමත් කර තිබේ. ගර්භගෘහයේ ප්‍රධාන බුද්ධ ප්‍රතිමාව වශයෙන් නිර්මාණය කර ඇත්තේ ධ්‍යාන මුද්‍රාවෙන් යුතු හිඳි බුද්ධ ප්‍රතිමාවකි. ඒ වටා අලංකාර රශ්මිමාලාවක් නිර්මාණය කර තිබේ. ප්‍රධාන බුද්ධ ප්‍රතිමාවට දෙපසින් දෑඅගසව්වන්ගේ ප්‍රතිමා දැකගත හැකිය. ප්‍රධාන බුද්ධ ප්‍රතිමාවට දකුණුපසින් විෂ්ණු දෙවියන්ගේ හිටි ප්‍රතිමාවකි.

ගර්භගෘහයේ දකුණුපස බිත්තියට ආබද්ධව විතර්ක මුද්‍රාව සහිත හිටි බුද්ධ ප්‍රතිමාවක් පිහිටුවා තිබේ. ඒ වටා අලංකාර රශ්මිමාලාවකි. හිටි බුද්ධ ප්‍රතිමාවට දකුණුපසින් අභය මුද්‍රාවෙන් යුතු මෛත්‍රී බෝසතුන්ගේ ප්‍රතිමාවකි. ගර්භගෘහයේ වම්පස බිත්තියට ආබද්ධව අභය මුද්‍රාව සහිත හිටි බුද්ධ ප්‍රතිමාවකි. ඒ වටා ද අලංකාර රශ්මිමාලාවකි. මහනුවර යුගයේ ප්‍රතිමා ලක්ෂණ සහිත ගර්භගෘහයේ බුද්ධ ප්‍රතිමා පසුකාලීන ප්‍රතිසංස්කරණවලදී නවීකරණය වී තිබේ (ඡායාරූපය 07).

ගර්භගෘහය මහනුවර යුගයේ සිතුවම්වලින් අලංකෘතව පැවතිය ද, මේ වන විට තත් යුගයට අයත් සිතුවම් කොටසක් ශේෂ වී ඇත්තේ ප්‍රධාන බුද්ධ ප්‍රතිමාවට පිටුපස වියන්තලයේ පමණි. ජ්‍යාමිතික මෝස්තර සහ මල් ලියවැල් සහිත වියන් මෝස්තරයක් එයින් හඳුනාගත හැකිය (ඡායාරූපය 08). 1940 දශකයේ සිදු කරන ලද ප්‍රතිසංස්කරණ හේතුවෙන් ගර්භගෘහයේ සිතුවම් සාර්ලිස් සිතුවම් සම්ප්‍රදාය යටතේ නිර්මාණය වී තිබේ. මෙයින් බිතුසිතුවම් සඳහා වස්තු විෂය වී ඇත්තේ බුදු සිරිතයි. වියන්තලය සරසා ඇත්තේ නෙළුම් මල් මෝස්තරයක් යොදාගෙන ය.

ලෙන් විහාරයේ දෙවන ගර්භගෘහය මෑත භාගයේද ඉදි කරන ලද්දකි. එහි ප්‍රධාන බුද්ධ ප්‍රතිමාව වශයෙන් නිර්මාණය කර ඇත්තේ සැතපෙන බුද්ධ ප්‍රතිමාවකි. මීට අමතරව සූවිසි විවරණය එහි මූර්තිමත් කර තිබේ.

විහාර පරිශ්‍රයේ දකුණු දෙසින් පිහිටි සංඝාවාස සංකීර්ණය ඉදිරිපස අනුරාධපුර යුගයේ ලක්ෂණ සහිත වැසිකිළි ගල්, කැසිකිළි ගල්, පැන්පාත්‍රා සහ හිටි බුද්ධ ප්‍රතිමාවල පාදම් ආදී ශිලා අවශේෂ කිහිපයක් දැකගත හැකිය. විහාර පරිශ්‍රයට උතුරු දෙසින් ඇති ප්‍රදේශය මේ වන විට වනගතව පවතී. ඒ ආශ්‍රිතව තවත් කටාර කොටන ලද ගල්ලෙන් කිහිපයක් පිහිටා තිබේ.

### 3.6 විහාර සඟ පරපුර

මහනුවර යුගයේදී පෙතියාගල රජමහ විහාරය, නාගොල්ල රජමහ විහාරය යටතේ පැවති විහාරයක් වූ හෙයින් පෙතියාගල වැඩසිටි භික්ෂූන් අයත් වූයේ රිදීවිහාර සඟ පරපුරට සම්බන්ධ 'නාගොල්ල සඟ පරපුරට' ය. ඒ යටතේ පෙතියාගල සඟ පරපුර පහත පරිදි වේ.



JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

වැලිවිට ශ්‍රී සරණංකර සඟරජ මාහිමි

↓

තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ බුද්ධරක්ඛිත මහනාහිමි

↓

පොල්පිතිගම ශ්‍රී සිද්ධාර්ථ අනුනාහිමි

↓

කැකුණාවේ සරණංකර හිමි

↓

පොල්පිතිගම සුදස්සි හිමි

↓

පොල්පිතිගම ධම්මරතන හිමි

↓

පොල්පිතිගම ගුණානන්ද හිමි [22]

එහෙත් වර්ෂ 1930දී පෙතියාගල රජමහ විහාරය, ඓතිහාසික නියඳවනේ පුරාණ රජමහ විහාරයට පවරාදීමත් සමග පෙතියාගල 'දරම්ටිපල සඟ පරපුර' සමග සම්බන්ධ වී තිබේ.

මල්වතු මහාවිහාර පාර්ශ්වයේ මහනායක පදවිය හෙබවූ දරම්ටිපොල ශ්‍රී ධර්මරක්ෂිත මහනාහිමියන්ගෙන් ඇරඹුණු දරම්ටිපොල සඟ පරපුර පසුව උන්වහන්සේගේ ප්‍රධාන ශිෂ්‍යයන් වැඩසිටි විහාරස්ථාන කේන්ද්‍ර කොටගෙන විකාශය වී තිබේ. ඒ අනුව ගල්ගිරියාව සහ වරාවල ආදී වශයෙන් දරම්ටිපොල සඟ පරපුරෙන් පැවත එන සඟ පරපුර කිහිපයකි.[23] ඒ අතරට 'නියඳවනේ සඟ පරපුර' ද අයත් වේ.

නියඳවනේ සඟ පරපුරට අයත් පෙතියාගල රජමහ විහාරයේ සඟ පරපුර වර්තමානය දක්වා පැවත එන්නේ පහත පරිදි ය.

වැලිවිට ශ්‍රී සරණංකර සඟරජ මාහිමි

↓

දරම්ටිපොල ශ්‍රී ධර්මරක්ෂිත මහනාහිමි

↓

බොරවැවේ ධම්මපාල අනුනාහිමි

↓

බොරවැවේ පියදස්සි හිමි

↓

හේරත්ගම ධම්මදස්සි හිමි

↓

බොරවැවේ මේධංකර හිමි

↓

කම්බුවටවන සිද්ධාර්ථ හිමි

↓

කම්බුවටවන සරණංකර හිමි

↓

බොරවැවේ රතනපාල හිමි

↓

පලීපාන ශ්‍රී සුමංගල හිමි

↓

හාතිගමුවේ ශ්‍රී සිද්ධත්ථ හිමි [24]

↓

පොතුවිල ශ්‍රී විමලඥාණ නාහිමි (වර්තමාන විහාරාධිපති)

## 4. සමාලෝචනය

පෙතියාගල ප්‍රදේශයේ කුඩා කඳුගැටයක් ආශ්‍රිතව පිහිටි පෙතියාගල රජමහ විහාරය, අනුරාධපුර යුගයේ ඉදි කරන ලද්දකි. අනතුරුව පොළොන්නරු යුගයේ මෙන්ම අවසන් වරට මහනුවර යුගයේ ද රාජානුග්‍රහය සහිතව මෙහි විහාර කර්මාන්ත සිදුව තිබේ. ඓතිහාසික වශයෙන් වටිනාකම් රැසක් පවතින මෙම විහාරයේ ඉතිහාසය ක්‍රමානුකූලව පෙළගැස්වීම මෙමගින් සිදු කර තිබෙන අතර ඊට සාහිත්‍ය මූලාශ්‍රය මෙන්ම දැනට හමුවන පුරාවිද්‍යා මූලාශ්‍රය යොදාගෙන ඇත. තව ද, මෙතෙක් අප්‍රකාශිතව නාගොල්ල සහ පෙතියාගල රජමහ විහාර සන්නස මෙම අධ්‍යයනය ඔස්සේ හඳුනාගෙන ප්‍රකාශයට පත් කරයි. දැනට විහාර අංග පිහිටා ඇති ප්‍රදේශය හැරුණු විට විහාර භූමියෙන් වැඩිකොටසක් වනයෙන් වැසී ඇති හෙයින් තවමත් විධිමත් පුරාවිද්‍යා ගවේෂණයක් හෝ කැණීමක් ඒ ආශ්‍රිතව සිදු වී නොමැත. එහෙයින් විහාර පරිශ්‍රයේ සිදුවන විධිමත් පුරාවිද්‍යා නිරීක්ෂණ ඔස්සේ මෙතෙක් අනාවරණය නොවූ පුරාවිද්‍යා සාධක රැසක් මතුකරගැනීමේ ඉඩප්‍රස්ථාව පෙනෙන්නට තිබේ.

[22] රතනජෝති නාහිමි (අප්‍රකාශිත කෘතිය), පි. 40

[23] රතනසාර නාහිමි, මානපහ (2016), *වරාවල රජමහ විහාරය*, කර්තෘ ප්‍රකාශන, පි. 27

[24]. සිද්ධත්ථ හිමි (1995), පි. xxx



JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

## නාගොල්ල සහ පෙතියාගල රජමහ විහාර සන්නස (වර්ෂ 1798) [25]

ස්වස්ති ශ්‍රී වෛවස්වත මනුසංඛ්‍යාත මහාසම්මත රාජවංශපරම්පරානුයාත ශුද්ධ සූර්‍ය්‍ය වංශාභිජාත රිපු තිමිරණකර විද්ධවංශනසහශ්‍රාංශු ප්‍රතිභාග අසදිසාතුල්‍ය ගම්භීරප්‍රවරෝදාරතර පුන්‍ය ඉර්ධි තේජෝ බල පරාක්‍රම සමන්විත **ශ්‍රීමත් ශ්‍රී වික්‍රම රාජසිංහ දෙවිස්වාමිදරුවාණන් වහන්සේ** ශ්‍රී බුද්ධ වර්‍ෂයෙන් දෙදාස් තුන්සිය එක්සාලිස්වන වර්‍ෂයෙහි ශ්‍රී ලංකාද්වීපයෙහි රාජ්ජශ්‍රීපදප්‍රාප්තව උදාරතර කුසලාධ්‍යායයෙන් යෙදී වදාරා ජිනසාසනාභිවෘද්ධි වර්‍ධනය කර වදාරණ සමයෙහි,

තපෝ ගුණරත්නාලංකෘත තිබ්බටුවාවේ නායක ස්ථවිර සාමීන්ගේ ශිෂ්‍ය වූ **පොල්පිටිගම සිද්ධාර්ථ නම් අනුනායක උන්වහන්සේ** සත් කෝරලේ දිවිගන්දහය බද නාගොල්ලේ විහාරෙ ජරාවාසව තුබූ විහාර කර්මාන්ත මුල් පිස හැර වඩු දොලොස් රියන් ශෛල මහ භිත්ති බඳවා සර්‍වඥ ධාතු වඩා මහාසයන ප්‍රතිබිම්බාදි සයන නිසීධන ස්ථිති බුද්ධ රූප සතර නමක් ද නාථෝත්පලවර්ණ දේව රූපද්වය ද වැඩ කරවා වියන් සිතියම්හි සහ භිත්ති ඇතුලත දෙසීයක් ප්‍රමාන බුද්ධ රූපයෙන් හා මාලා කර්මලතා කර්මාදීන් සිතියම් කරවා ද්වාරාභිමුඛයෙහි මිලී මකරතොරණ සහ දෙපාර්ශවයෙහි දොරටුපාල රූප දෙකක් ද වැඩ කරවා පිට භිත්තිවල වෙස්සන්තර ජාතකාදී නොයෙක් ජාතක සිතියම් කරවා විහාර මණ්ඩප්පය ද තනවා ඊට නුදුරින් වූ **පෙතියාගල විහාරය ද සිත නිසීදන ස්වරූප බුද්ධ රූප තුන් නමකින් සෝභමානව විසිතුරු සිතියමින් නිමවා නේත්‍ර මංගල්‍යයට දුන මනා වස්ත්‍රාභරණාදී ප්‍රදානයෙන් මංගල්‍යොත්සවයෙන් නේත්‍රා පිහිටුවා පූජෝත්සව පවත්වමින්** තදන්තරව ගණන් දුටු දෙයින් තුන්දාස් පන්සියයක් දේ චිත්‍රකාරාදීන්ට බරපැන් පිණිස පරිත්‍යාග කොට විහාර පින්කම සමුද්ධි කොට යථෝක්ත පුන්‍ය සම්භාරයන් අනුමෝදන්වී වදාරණ සැටියට ත්‍රිසිංහලාධීස්වර පරරාජරාජෙස්වර වූ උතුම් **ශ්‍රී වික්‍රම රාජසිංහ දෙවිස්වාමිදරුවාණන් වහන්සේගේ** ශ්‍රී මහා කරුණා දිවස් එළියේ මහිමතාවයට ඔප්පු කළ තැනේදී,

ඊට ශ්‍රී චිත්තාරවින්ද ප්‍රබෝධය කොට පුන්‍ය ග්‍රහීත වී වදාරා මෙම විහාරස්ථානයෙහි පුද සිරිත් මතු අඛණ්ඩව පවතිනා සැටියට විහාර සන්තකව තිබෙන ගන් කුඹුරුවලින් සුබසිංහගම ද කෝරාවාගාල ද දෙකන්දේ අස්වැද්දුම ද ගලපිටගමෙ බිජු අමුන ද පොල්පිටිගම වෙල පහල දළුපොත වෙල මැද තුංහිරියාවලෙන් ඉහලත් තිඹිරිගහෙන් පහලත් මැදි වූ බිජු පස්පැල ද පෙතියාගල විහාරෙ ගාවා දළුපොත සහ වත්ත බලගොල්ලෙ වෙලේ බිජු පහිනි පැල ද මිරිහන්පිටිගම වෙලේ බිජු පැල ද ඇතුළු වූ මෙම විහාර සන්තක ගං කුඹුරුවලින් උපදනා ප්‍රත්‍යයෙන් මෙම **නාගොල්ලේ පෙතියාගල විහාරස්ථාන දෙකේ පුදසිරිත් පොල්පිටිගම සිද්ධාර්ථ නම් අනුනායක උන්වහන්සේගේ** ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවෙන් ස්වස්ථිරව පවත්වන සැටියට ශකවර්‍ෂ එක්වාදහස් සත්සිය විසිවන රක්තාක්‍ෂි නම් වර්‍ෂයෙහි බිනර මස පුර විසේනි නම් තිථිය ලත් ඉරිදා කටුපුළුලබද සෙංඛණ්ඩ ශෛලාභිධාන ශ්‍රීවර්ධනපුරප්‍රවරයෙහි ස්වර්ණවර සිංහාසනාරූඪව ශක්‍ර දේවේන්‍ද්‍ර විලාසයෙන් වැඩහිඳ සර්ධාපූර්වාංගම උදාරතර කරුණාධ්‍යාසයෙන් යෙදී වදාරා මතු සාසනාන්තර්ධානය දක්වා රාජරාජමහාමාත්‍යාදී කිසි කෙනෙකුන් විසින් අවුලක් උද්ධරණයක් නොකරණ සේ ස්වස්ථිරව පවත්නා නියාවෙන් මේ සන්හස දෙවා වදාල පනතත් ඒ පණතත් මෙසේම පතිවුඩ පනතයි

[25]. රතනජෝති නාහිමි (අප්‍රකාශිත කෘතිය), පි. 57-60


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

## ආශ්‍රිත මූලාශ්‍රය


- *ඌන පූරණ සහිතො මහාවංසො* (1959), බුද්ධදත්ත හිමි, පොල්වත්තේ (සංස්.), ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

- ගුණානන්ද හිමි, පහමුණේ (2008), 'මහනාහිමිවරු', *කුරුණෑගල ශාස්ත්‍රීය සංග්‍රහය*, සීලක්ඛන්ධ හිමි, තුඹුල්ලේ සහ කරුණාරත්න, ජී. (සංස්.), වයඹ පළාත් සභාව, කුරුණෑගල.

- ඤාණරතන හිමි, කිරිඳිගල්ලේ (2019), 'මාරතුගොඩ විදුමිණ පිරිවෙනට 50 වසරයි', *දිනමිණ*, පෙබරවාරි 25

- *පාලි-සිංහල ශබ්දකෝෂය* (1965), සුමංගල හිමි, මඩිතියවෙල (සම්.), ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

- පියදස්සි ස්ථවිර, නැහිනිවෙල (2004), 'මල්වතු මහාවිහාරීය මහානායක පරපුර', *මල්වතු මහා විහාරය සහ මහ පදවිය* - අතිගෞරවාර්හ තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගල මහනාහිමි උපහාර ලිපි සංග්‍රහය, විමලබුද්ධි ස්ථවිර, වල්ගොව්වාගොඩ, විජිතසිරි ස්ථවිර, නියංගොඩ හා ධම්මරක්ඛිත ස්ථවිර, කුළුගම්මන ඇතුලු තවත් අය (සංස්.), මධ්‍යම සංස්කෘතික අරමුදල, කොළඹ.

- රතනජෝති නාහිමි, ගනේගොඩ, *සැඟවුණ ප්‍රදබිමක පුරාවෘත්තය - පොල්පිතිගම නාගොල්ල රජමහ විහාරය* (අප්‍රකාශිත කෘතිය)

- රතනසාර නාහිමි, මානපහ (2016), *වරාවල රජමහ විහාරය*, කර්තෘ ප්‍රකාශන.

- ලියනගේ, සේපාල (2013), 'නියඳවන රජමහ විහාරය අභාවයට', *දිවයින*, ජුනි 06

- විමලබුද්ධි ස්ථවිර, වල්ගොව්වාගොඩ, විජිතසිරි ස්ථවිර, නියංගොඩ හා සෙනෙවිරත්න, අනුරාධ (1992), *මල්වතු මහාවිහාර සංඝ පරම්පරාව (අනුනායක පදවිය)*, බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව, කොළඹ.

- *සංඝරාජ සාධු චරියාව* (1997), විමලවංස හිමි, අකුරටියේ සහ සෙනෙවිරත්න, නාගොඩ ආරියදාස (සංස්.), සමයවර්ධන ප්‍රකාශන, කොළඹ.

- සන්නස්ගල, පුඤ්චිබණ්ඩාර (2013), *සිංහල සාහිත්‍ය වංශය*, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

- සිද්ධත්ථ හිමි, හාතිගමුවේ (1995), 'නියඳවනේ විහාර පාර්ශවය - සඟ පරපුර', *සිරි රතනපාල අභිනන්දන* - බොරවැවේ රතනපාල නාහිමි අභිනන්දන ශාස්ත්‍රීය සංග්‍රහය, අමරමෝලි හිමි, එගොඩමුල්ලේ සහ ඤාණරතන හිමි, වලස්වැවේ (සංස්.), රුවන් බෝධි පිරිවෙන, ගැට්ටුවාන.

- *සිංහල මහාවංසය* (1994), සුමංගල හිමි, හික්කඩුවේ සහ දේවරක්ෂිත, බටුවන්තුඩාවේ (පරි.), රත්න ප්‍රකාශකයෝ, කොළඹ.

- සුධම්ම හිමි, රාවාඇලේ (2019), *නියඳවනේ හා බැඳුණු පෙතියාගල සඟ පරපුර*, රාවාඇලේ සුධම්ම හිමි පදනම, දාගම.

- සුමංගල හිමි, පහමුණේ (2008), 'අනුනාහිමිවරු', *කුරුණෑගල ශාස්ත්‍රීය සංග්‍රහය*, සීලක්ඛන්ධ හිමි, තුඹුල්ලේ සහ කරුණාරත්න, ජී. (සංස්.), වයඹ පළාත් සභාව, කුරුණෑගල.

- සෝමරතන හිමි, ඇඹුල (1984), 'මාතලේ දිසාවේ සඟ පෙළපත්', *ඓතිහාසික මාතලේ*, සාසනතිලක නාහිමි, මාතලේ, සුමනජෝති නාහිමි, පරණගම හා නන්දාරාම හිමි, තිස්මඩ ඇතුලු තවත් අය (සංස්.), මාතලේ දිසා සංස්කෘතික මණ්ඩලය, මාතලේ.

- පුද්ගල සම්ප්‍රේෂණ - ඓතිහාසික පෙතියාගල රජමහ විහාරය ඇතුලු විහාර ගණයේ විහාරාධිපති ස්‍යාමොපාලි මහානිකායේ මල්වතු මහාවිහාර පාර්ශ්වයේ තිකවාගම්පහ දිවිගන්දහ දෙකෝරළයේ ප්‍රධාන සංඝනායක පූජ්‍ය පොතුවිල ශ්‍රී විමලඤාණ නාහිමි, 2019 ජුනි මස 21 සෙනසුරාදා

- පුද්ගල සම්ප්‍රේෂණ - ඓතිහාසික පොල්පිතිගම නාගොල්ල රජමහ විහාරය හා තිහව ගස්සන්දළුපොත පුරාණ විහාරයේ විහාරාධිපති සහ ස්‍යාමොපාලි මහානිකායේ මල්වතු මහාවිහාර පාර්ශ්වයේ උපාධ්‍යාය හා හිරියාල හත්පත්තුවේ ප්‍රධාන අධිකරණ සංඝනායක පූජ්‍ය ගනේගොඩ ශ්‍රී සිද්ධාර්ථ ධම්මපාල රතනජෝති නාහිමි, 2019 ජුනි මස 22 ඉරිදා

- *Inscriptions of Ceylon* Vol. I (1970), Paranavitana, S., Department of Archeology, Colombo



JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

– Műller, Edward (1984), *Ancient Inscriptions of Ceylon*, Asian Educational Services, New Delhi

– Nicholas, C.W. (1963), *Historical Topography of Ancient and Medieval Ceylon, JRAS-CB,* Royal Asiatic Society Ceylon Branch, Colombo.



*JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka.* jahs@ssh.rjt.ac.lk